මහාචාර්ය තිස්ස විතාරණ මහතා,
ප්‍රධාන ලේකම්,
ලංකා සමසමාජ පක්ෂය,
කොළඹ,
ශ්‍රී ලංකාව.

අනූ වැනි සංවත්සරය සමරන සමසමාජ පක්ෂය ඩොනමෝර් යුගයේ සිට මෙරට දේශපාලනයට විශාල බලපෑමක් කළ ව්‍යාපාරයකි. සමාජවාදී - මාක්ස්වාදය සංකල්පය ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිවන්නේද සමසමාජ පක්ෂයටය.

හතර වැනි ජාත්‍යන්තරයේ ට්‍රොස්කිවාදය නියෝජනය කිරීම සමසමාජ පක්ෂය මගින් සිදුවේ. 40 දශකයේ සිට 70 දශකය දක්වා සෝවියට් සංගමයේ කොමියුනිස්ට් මතවාදයටත්, චීන කොමියුනිස්ට් මතවාදයටත් පරිබාහිරව මාක්ස්වාදී - සමාජවාදය වෙනුවෙන් සමසමාජ පක්ෂය පෙනී සිටියේය. එය සුවිශේෂ කරුණකි.

සමසමාජ පක්ෂය 1936 සිට ආණ්ඩු ඇතුළතත්, ඉන් පිටතත් මෙරටට දේශපාලන ගමන් මගට කළ බලපෑම් අප්‍රමාණය. මාර්ක් ඇන්ටනි බ්‍රේස්ගර්ඩ්ල් සිදුවීමේදී ආණ්ඩුකාරවරයාගේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් “හේබියස් කෝපුස්” නඩුවක් ජයග්‍රහණය කිරීම මෙරට නිදහස් ව්‍යාපාරය තුළ දකින්න ලැබුණු සුවිශේෂී ප්‍රවණතාවයකි.

එක්සත් ජාතික පක්ෂයේ සිටින අපට ඩඩ්ලි සේනානායක, ජේ. ආර් ජයවර්ධන යන මහත්වරුන් යටතේ පිටත ක්‍රියාත්මක වූ න්‍යායාත්මක සමාජවාදී මතවාදවලට මුහුණදීමට සිදුවිය. ඒ මත ගැටුම් වලින් මෙරට දේශපාලනය එදා මුවහත් වූ බව නොරහසකි. මගේ පියා එක්සත් ජාතික පක්ෂයට බැඳෙන තෙක් සමසමාජ පක්ෂයේ මුල් සාමාජිකයෙක් ලෙස ක්‍රියා කළේය.

අප පක්ෂ දෙක ට්‍රොස්කිවාදී, මාක්ස්වාදී, සමාජවාදී මෙන්ම මධ්‍ය දක්ෂිනාංශික දේශපාලනය තුළ ගැටුම් ඇතිකර ගැනීම මෙන්ම එකට වැඩ කිරීමද කැපී පෙනෙන ලක්ෂණයකි. මගේ දේශපාලන ජීවිතයේදී ඇමතිවරයෙකු, අගමැති මෙන්ම ජනාධිපති ලෙසද ඔබ පක්ෂය සමග එකට වැඩ කිරීමට අවස්ථාව උදා වූයේය. විශේෂයෙන්ම ඉන්දු - ලංකා ගිවිසුමේදීත්, බලය බෙදා හැරීමේදීත් අපි එක් ස්ථාවරයක සිට කටයුතු කළෙමු.

සමසමාජ පක්ෂයේ ආචාර්ය එන්. එම් පෙරේරා, කොල්වින් ආර්. ද. සිල්වා යන නායකයින් මෙන්ම පසුව වෙනත් වාමාංශික කඳවුරුවලට ගිය පිලිප් ගුණවර්ධන, එස්. ඒ. වික්‍රමසිංහ යන අයවලුන්ද හඳුනා ගැනීමට අපට අවස්ථාව ලැබිණි.

මා ජීවත් වන දකුණු කොළඹ ආසනය ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා සමග නියෝජනය කරනු ලැබුවේ සමසමාජ පක්ෂයේ බර්නාඩ් සොයිසා මහතාය. මේ ආකාරයේ සම්බන්ධතා රැසක් ගෙන හැර දැක්වීමට පුළුවන.

සමසමාජ පක්ෂය රටට කළ සේවය 90 වැනි සංවත්සරය සමරන අවස්ථාවේදී සිහිපත් කරමින් ඔබ ඇතුළු සියලු දෙනාටම සුභ ප්‍රාර්ථනා කරමි.

**රනිල් වික්‍රමසිංහ**
Viii වැනි විධායක ජනාධිපති
2025 දෙසැම්බර් 18